# තනතුරු ඇබෑර්තු

# අම්බලන්ගොඩ නගර සභාව

# දකුණු පළාත් රාජ්‍ය සේවයේ තනතුරු පුරප්පාඩු

අම්බලන්ගොඩ නගර සභාවේ දැනට පුරප්පාඩු වී පවත්නා පහත සඳහන් තනතුරු සඳහා බඳවා ගැනීමට සුදුසුකම් ඇති දකුණු පළාත් සභා බල ප්‍රදේශය තුල ස්ථිර පදිංචිකරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

| අනු අංකය | තනතුරු නාමය | තනතුරු සංඛ්‍යාව | වැටුප් ක්‍රමය | අධ්‍යාපන සුදුසුකම් හා බඳවා ගැනීමේ ක්‍රමය |
|---|---|---|---|---|
| 01. | පුස්තකාල සහායක | 01 | PL 1 -2016<br>24250-10x250 -10x270<br>10 x300-12x330-36410<br>(රා .පරි .ච .ලේ. 3/2016 ප්‍රකාරව ගැලපීම් කරනු ලැබේ) | අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ)විභාගයේදී දෙවරකට නොවැඩි වාර ගණනකදීයටත් පිරිසෙයින් සම්මාන දෙකක් සහිතව විෂයයන් හය(06)ක් සමත්වී තිබිය යුතුය. |

**බඳවා ගැනීමේ පොදු සුදුසුකම් :-**

1. අයදුම්කරු පරම්පාවෙන් හෝ ලියාපදිංචි වීමෙන් ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.
2. අයදුම්කරු විශිෂ්ඨ චරිතයකින් හා මනා ශරීර සෞඛ්‍යකින් යුක්ත විය යුතුය. පත්වීම සඳහා තෝරා ගත හොත් මසක් ඇතුලත රජයේ වෛද්‍ය පරීක්ෂණයකට පෙනී සිටිය යුතු අතර එම පරීක්ෂාවේදී නුසුදුස්සකු වශයෙන් පෙනී ගියහොත් පත්වීම අවලංගු කරනු ලැබේ.
3. ඉල්ලුම්පත් භාරගන්නා අවසාන දිනට වයස අවු: 18 - 45ත් අතර විය යුතුය . (ස්ථිර තනතුරක සිටින අභ්‍යයන්තර අයදුම්කරුවෙකුට උපරිම වයස සීමාව අදාළ නොවේ.)
4. අයදුම්පත් භාරගන්නා අවසාන දිනට පූර්වාන්න වසර 03 ක දකුණු පළාත තුළ ස්ථිර පදිංචිකරුවකු විය යුතුය. පදිංචි වසමේ ග්‍රාම නිලධාරි විසින් නිකුත් කරන ලද සහතිකය මත අදාල ප්‍රාදේශීය ලේකම් විසින් අනු අත්සන් කර නිකුත් කරන ලද ලියවිල්ලකින් පදිංචිය සනාථ කළ යුතුය.
5. දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියකින් වරදකරු වී හෝ රජයේ හෝ රාජ්‍ය සේවයෙන් පහ කරනු ලැබූ අයෙකු නොවිය යුතුය.

**සේවා නියුක්ත කිරීමේ කොන්දේසි :-**

1. සුදුසුකම් පරීක්ෂා කිරීම ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයෙදීම සිදු කෙරේ. දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ පූර්ව අනුමැතිය ලත් සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මගින් සම්මුඛ පරීක්ෂණය පවත්වනු ලැබේ.

**සම්මුඛ පරීක්ෂණයේදී ලකුණු ලබා දෙන ක්ෂේත්‍රයන් සහ ලකුණු ප්‍රමාණයන්:**

| | ලකුණු ලබා දෙනු ලබන ප්‍රධාන ක්ෂේත්‍ර | උපරිම ලකුණු ප්‍රමාණය | තොරා ගැනීමට සලකා බලනු ලබන අවම ලකුණු ප්‍රමාණය |
|---|---|---|---|
| 1 | අධ්‍යාපන සුදුසුකම් | 30 | 50% |
| 2 | අමතර සුදුසුකම් | 10 | |
| 3 | පළපුරුද්ද | 10 | |
| 4 | සභා බල ප්‍රදේශය තුල පදිංචිය | 45 | |
| | සම්මුඛ පරීක්ෂණයේදී දක්වන කුසලතාවය | 05 | |
| | එකතුව | 100 | |

2. තනතුරට හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය සම්බන්ධයෙන් රජය විසින් ඉදිරියේදී ගනුලබන ප්‍රතිපත්තිමය තිරණ වලට යටත් විය යුතුය.
3. වැන්දඹු / වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට දායක මුදල් ගෙවිය යුතුය.
4. පත්වීම අවුරුදු 03 ක පරිවාස කාලයකට යටත්වේ.
5. මෙයට අමතරව ශ්‍රී ලංකා ජනරජයේ ආයතන සංග්‍රහය සහ මුදල් රෙගුලාසි වලට ද , දකුණු පළාත් ගරු ආණ්ඩුකාරතුමාගේ නියෝග වලට ද, වරින් වර දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් නිකුත් කරන රෙගුලාසි වලට හා නියෝග වලට ද අනුකූලව සේවය කිරීමට බැඳී සිටිය යුතුය.
6. මෙම ක්ෂේත්‍රයේ පළපුරුද්ද ලබා තිබීම කෙරෙහි විශේෂ සැලකිල්ලක් දක්වනු ලැබේ.
7. අයදුම්පත් කැඳවීමෙන් පසු හෝ කැඳවන අතර තුර කාල සීමාවේදී හෝ බඳවා ගැනීම ප්‍රමාද කිරීම හෝ වෙනස් කිරීම මෙම නිවේදනය අවලංගු කිරීම හෝ සංශෝධනය කිරීමේ බලය අම්බලන්ගොඩ නගර සභාවේ ගරු සභාපති සතුය.

අයදුම්පත් ඉදිරිපත් කිරීම.

1. මෙම නිවේදනයේ දක්වා ඇති ආදර්ශ අයදුම් පත්‍රය අනුව සකස් කරන ලද අයදුම්පත් ඉදිරිපත් කළ යුතුය.(අයදුම් පත්‍රය A4 ප්‍රමාණයට සකස් කල යුතුය). අයදුම්පත් බහාලන කවරයේ වම් පස ඉහළ කෙළවරේ අදාල තනතුර පැහැදලිව සඳහන් කළ යුතුය. අසම්පූර්ණ, අපැහැදිලි,මෙන්ම නියමිත දිනට පසුව ලැබෙන අයදුම්පත් කිසිදු දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

2. සම්පූර්ණ කරන ලද අයදුම්පත් පහත සඳහන් සහතිකවල ඡායා පිටපත්ද සමගින් 2018 ............ වන දිනට පෙර ලියාපදිංචි තැපැලෙන් ලේකම්, නගර සභාව, අම්බලන්ගොඩ යන ලිපිනයට එවිය යුතුය.

අ ) උප්පැන්න සහතිකය

ආ) අධ්‍යාපන සහතිකය

ඇ) මෑතකදී ලබා ගත් චරිත සහතික 02 ක්

ඈ) පදිංචිය සනාථ කිරීමට ප්‍රාදේශීය ලේකම් සනාථ කළ ග්‍රාම නිලධාරි සහතිකය

ඉ ) වෘත්තීය සුදුසුකම් හා පළපුරුද්ද තිබේ නම් ඒ බව සනාථ කෙරෙන සහතික

ඊ ) සේවා සහතිකය

**සැලකිය යුතුයි :-**

දැනට රාජ්‍ය සේවයේ නියුතු වූවන් තමන්ගේ අයදුම්පත් ආයතන ප්‍රධානියාගේ නිර්දේශය මත එවිය යුතුය. අයදුම්පත් සමග එවන සහතිකවල මුල් පිටපත් සම්මුඛ පරීක්ෂණයේදී ඉදිරිපත් කළ යුතුය.

සභාපති
අම්බලන්ගොඩ නගර සභාව.

2018ක්වූ ................. මස ............... වැනි දින
අම්බලන්ගොඩ නගර සභා කාර්යාලයේදී ය.

යොමු අංකය -

(කාර්යාලීය ප්‍රයෝජනය සඳහා)

ආදර්ශ අයදුම් පත්‍රය

අම්බලන්ගොඩ නගර සභාව

..................................................තනතුර සඳහා අයදුම්පත්‍රය

01. අයදුම්කරුගේ සම්පූර්ණ නම : ______________________

02. මුලකුරු සමග නම : ____________________________

03. ස්ථිර ලිපිනය : ________________________

04 .ජාතික හැඳුනුම්පත් අංකය :_____________________________

05. උපන් දිනය : වර්ෂය : ___________ මාසය : ________ දිනය : ___________

06. අයදුම්පත් භාරගන්නා අවසන් දිනට වයස : __________________________

07. ජාතිය : ________________________

08. ආගම : ____________________

09. විවාහක / අවිවාහක බව : ________________________

10. ස්ත්‍රී / පුරුෂ භාවය : _____________________

11. ඔබ ශ්‍රී ලංකා පුරවැසියෙක්ද ? එසේ නම් ඒ පරම්පරාවෙන්ද ? ලියාපදිංචි වීමෙන්ද යන වග : _____________

12. දකුණු පළාත් සභා බල ප්‍රදේශය තුල ස්ථිර පදිංචි කාලය : ________________________

13. අධ්‍යාපන සුදුසුකම් : _________________

(1) අ.පො.ස. (සාමාන්‍ය පෙළ)

| විෂයයන් | සාමාර්ථය | විෂයයන් | සාමාර්ථය |
|---|---|---|---|
| 1. | | 5. | |
| 2. | | 6. | |
| 3. | | 7. | |
| 4. | | 8. | |

14. ඔබ ලබා ඇති ඉහළම අධ්‍යාපන සුදුසුකම : _______________________

15. වෙනත් සුදුසුකම් :_________________________

16. සේවා පළපුරුද්ද : __________________________

17. ඔබ කවරදාක හෝ චෝදනාවක් ලැබ උසාවියකින් වරදකරුවකු වී තිබේද ? : ______________________

ඉහත සඳහන් කරන ලද තොරතුරු සත්‍ය හා නිවැරදි බව මෙයින් සහතික කරමි.සාවද්‍ය තොරතුරු සපයා තිබුණහොත් සම්මුඛ පරීක්ෂණයට පෙර හෝ පසුව අපේක්ෂත්වය අවලංගු වන බවත් තෝරා ගැනීමෙන් පසුව අනාවරණය වුවහොත් සේවයෙන් පහ කිරීමට යටත් වන බවත් දන්වමි.

අයදුම්කරුගේ අත්සන

**රාජ්‍ය සේවයේ නියුක්ත අයදුම්කරුවන් සඳහා**

ඉහත නම සඳහන් ...................................... මයා දැනට මෙම ආයතනයේ .........................වශයෙන් සේවය කරයි . ඔහු / ඇය මෙම තනතුරට තෝරාගත හොත් සේවයෙන් නිදහස් කල හැකිය./ නොහැකිය. ඔහු / ඇය විනයානුකූල දඬුවමකට ලක් වී නොමැති බව මින් සහතික කරන අතර අයදුම්පත නිර්දේශ කර ඉදිරිපත් කරමි.

______________________________

දෙපාර්තමේන්තු / ආයතන ප්‍රධානියාගේ

අත්සන

නම:________________________________________

පදවි නාමය : ____________________________________

දෙපාර්තමේන්තුව / ආයතනය : __________________________

(නිල මුද්‍රාව තබන්න)

දිනය : ____________________